**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වන වගන්තිය සමඟ සංශෝධිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 231 | සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් වෙත රු. 119,500 ක් ගෙවා තිබුණු නමුත් එම ගෙවීමට අදාළ තොරතුරු ගෙවීම් වවුචර් සමඟ ඉදිරිපත් නොකෙරුණි. | ආයතනය අභ්‍යන්තර විගණන කාර්යය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්යන්තර විගණන අංශයේ සේවය ලබා ගැනීම වෙනුවෙන් සිදු කරනු ලබන ගෙවීම් වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් තහවුරු කිරීමට අදාළ සාක්ෂි ඉදිරපත් කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 3 කදී තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි | අත්තිකාරම් ලබාදෙනුයේ අවශ්‍ය කාර්ය සඳහා ප්‍රමාණවත් වන මුදල සැලකිල්ලට ගෙනයි. එහිදී රු. 100,000 සීමාව මතම කටයුතු කිරීම දුෂ්කර වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපරිම සීමාව ඉක්මවා රු. 136,650 සිට රු. 293,364 ක් දක්වා අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | . | |
| iii. මුදල් රෙගුලාසි 371 (2) (ආ) | මාණ්ඩලික නිලධාරීන් වෙත පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් තිදෙනෙකු වෙත රු. 9,000 සිට රු. 100,000 දක්වා අතුරු අග්‍රිම තිබුණි. | මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීම ඇතැම් අවස්ථාවලදී සිදු කරනු ලබන අතර එම අත්තිකාරම් ප්‍රයෝජනයට ගනුයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 114,002,565 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 171,800,211 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,797,646 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාඨමාලා ගාස්තු හා වෙනත් ආදායම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 248 ක් වූ ගොඩනැගිල්ලක II වන අදියරයෙහි ඉදිකිරීම්, 2018 – 2020 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ ආයතනය උපයාගත් ආදායමින් නිම කිරීමට ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත | කොන්ත්‍රාත් කාලය ඉක්මවා තිබුණද කොන්ත්‍රාත් කටයුතු අවසන් නොවීමට කොවිඩ් 19 හී බලපෑම නිසා රට වසා තැබීම, අමුද්‍රව්‍ය හා වෙනත් යෙදවුම්වල හිඟය, විදුලි බිල | නියමිත කාලය තුළදී කොන්ත්‍රාත්තුව අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2019 අගෝස්තු මාසයේ ආරම්භ කර දින 720 කින් නිම කිරීම සඳහා රු.මිලියන 180.65 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. විගණිත දිනය වූ 2022 පෙබරවාරි 18 දිනට ගිවිසුම් ගත කාලය දින 182 කින් ඉක්මවා තිබුණු නමුත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි. | සැපයුම අඩාල වීම සේවකයින් ලබාගැනීමේ දුෂ්කරතා ආදිය හේතු වී ඇති බව ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී කොන්ත්‍රාත්කරු ප්‍රකාශ කරන ලද අතර ඒ පිළිබඳව එම රැස්වීමේදී නිරන්තර සාකච්ඡාවලට භාජනය වී ඇත. | |
| (ආ) | 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. 278,846 ක් වටිනා පොත් 500 ක් සහ 2020 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.873,750 ක් වටිනා පොත් 699 ක් නිකුත් කිරීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශන තොගයෙහි ඇතුළත්ව පැවතුණි. | එකවර පොත් තොගයක් මුද්‍රණය කරවාගනුයේ මුද්‍රණ පිරිවැය වාසි සැලකිල්ලට ගෙනයි. අදාළ පොත් තොග වාර්ෂිකව, අවශ්‍යතාවය පරිදි සිසුන් වෙත නිකුත් කෙරේ. | ඉතිරි තොග පිළිබඳව සැලකිලිමත් වී මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ඇ) | පශ්චාත් උපාධි පාඨමාලා කාලය වර්ෂ දෙකක් වන බැවින් එම කාල සීමාව අවසානයේ හිඟ පාඨමාලා ගාස්තු ලියා හැරීමට කටයුතු කර තිබුණු නමුත්, එපරිදි වර්ෂ 02 ක කාලයක් ඉක්මවා නොතිබුණු 2020/21 වර්ෂයට අදාළ එකතුව රු.10,631,597 ක් වූ ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂය තුළදී ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායමෙන් ලියා හැර තිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂය තුළ 2018/2019 හා ඊට පෙර වර්ෂවලට අදාළ එකතුව රු.30,233,624 ක් වූ ශේෂ 09 ක් ලියා හැරීමකින් තොරව පැවතුණි. ඒ අනුව ලියාපදිංචි සිසුන් වාර්ෂිකව පාඨමාලා ගාස්තු නොගෙවීම හෝ පාඨමාලාව හැරයාම ආයතනයේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂය තුළ ලියාහරින ලද රු. 10,631,597 ක හිඟ පාඨමාලා ගාස්තු 2020/2021 වර්ෂයට අදාළ වන බැවින් 2021 වර්ෂයේ ලියාහැරීම සිදුකර ඇත. 2018/2019 හා ඊට පෙර වර්ෂවලට අදාළ හිඟ මුදල් සක්‍රීය සිසුන්ට අදාල වේ. | පාඨමාලා ගාස්තු ලියා හැරීම සම්බන්ධව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතු ය. |